# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 52 දරන
# තේ පර්යේෂණ මණ්ඩල පනත

---

[සහතිකය සටහන් කළේ 1993 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.20 ශ.    තැපැල් ගාස්තුව : රු. 1.00 ශ.

## 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1993 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඔ. 62/91

**තේ පර්යේෂණ මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද ඒ සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. *ලුහුඬු නාමය.*

### 1 වන කොටස

### තේ පර්යේෂණ මණ්ඩලය පිහිටුවීම

2. මේ පනතේ විධිවිධානවලට අනුකූලව (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) තේ පර්යේෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. *තේ පර්යේෂණ මණ්ඩලය පිහිටුවීම.*

3. (1) මණ්ඩලය, 2 වන වගන්තියෙන් ඊට දෙන ලද, නාමයෙන් සංස්ථාවක් විය යුතු ය. තව ද ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ඒ නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය. *මණ්ඩලය සංස්ථාවක් විය යුතු බව.*

(2) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, තලවාකැලේ හෝ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයක පිහිටුවනු ලැබිය හැකි ය.

4. මණ්ඩලයේ මුද්‍රාව— *මණ්ඩලයේ මුද්‍රාව.*

(අ) මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු යම් නිර්මාණයක් අනුව විය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ රීතිවලට අනුව මිස කිසිම ලේඛනයකට තබනු නොලැබිය යුතු ය.

5. තේ වගා කිරීම සහ නිෂ්පාදනය කිරීම පිළිබඳ පර්යේෂණ කිරීමෙහිලා නියුක්තවීම සහ ඒ සඳහා අනුබල දීම, පෝෂණය කිරීම හා පහසුකම් සැලසීම ද යනාදිය මණ්ඩලයේ කර්තව්‍ය වන අතර විශේෂයෙන් ම— *මණ්ඩලයේ කර්තව්‍ය.*

(අ) තේ වගාවට හානි පමුණුවන පළිබෝධ නැසීම හා පාලනය කිරීම, තේ වගාවට හානිකර වන රෝග වැළැක්වීම හා පාලනය කිරීම සහ තේවල ගුණාත්මක භාවය වැඩි දියුණු

කිරීම ද ඇතුලුව තේ වගා කිරීම සහ නිෂ්පාදනයට බලපාන සියළු ප්‍රශ්න හා කාරණා පිළිබඳ විද්‍යාත්මක හා තාක්ෂණික පර්යේෂණ පැවැත්වීම සහ විමර්ශනය කිරීම, ඒවාට සහාය වීම හා ඒවාට අනුබල දීම; තේ වලින් නිෂ්පාදිත දේ විවිධාංගකරණය මෙන්ම එම පර්යේෂණවල ප්‍රතිඵල මණ්ඩලයේ අභිමතය පරිදි ප්‍රචාරය කිරීම සහ පතළ කිරීම;

(ආ) ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ අනාගත ආර්ථික ප්‍රවනතා ද ඇතුලුව එම කර්මාන්තයේ ආර්ථික ස්වශක්තතාව පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, එහි ලා සහාය වීම සහ ඊට අනුබල දීම;

(ඇ) තලවාකැලේ පිහිටි තේ පර්යේෂණ ආයතනය හා එහි උප ආයතන මණ්ඩලයේ රීතිවලට අනුකූලව පවත්වා ගෙන යාම හා පරිපාලනය කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි පර්යේෂණ ආයතනා සමග සම්බන්ධතා ඇතිකර ගැනීම හා පවත්වා ගෙන යාම;

(ඉ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී, විදේශීය පර්යේෂණ ආයතන සහ ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සමග ඒකාබද්ධ අධ්‍යයන වැඩ පිළිවෙලවල්, සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම

විය යුතු ය.

මණ්ඩලයේ බලතල.

6. මණ්ඩලය විසින් එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය බලතල මණ්ඩලයට තිබිය යුතු අතර, විශේෂයෙන් පහත දැක්වෙන කටයුතු සියල්ලම හෝ ඉන් කිසිවක් කිරීම සඳහා බලතල තිබිය යුතු ය :—

(අ) යම් බද්දක්, මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, රික්ථ වරණයක් මගින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය සතු විය හැකි වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම සහ දැරීම ද, ඒ දේපළ මණ්ඩලයේ රීතිවලට යටත්ව බදුදීම, විකිණීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පත් ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම;

(ඇ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි හෝ ලබා ගැනීම නිසා මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම පහසු කරවන යම් සොයා ගැනීමක් පිළිබඳ යම් තොරතුරක් ප්‍රයෝජනයට ගැනීමේ අනන්‍ය හෝ අනන්‍ය නොවන හෝ සීමාසහිත අයිතියක් ලබාදෙන යම් ප්‍රත්‍යක්ෂණ පත්‍රයක්, බ්‍රිවෙට්ස් ඩි ඉන්වෙන්ෂන් පත්‍රයක් හෝ අනුග්‍රහයක් සඳහා ඉල්ලුම් කිරීමට, මිලදී ගැනීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ දේපළ අයිතිවාසිකම් සහ එසේ ලබාගත් තොරතුරු ප්‍රයෝජනයට ගැනීමට, සංවර්ධනය කිරීමට හෝ බලපත්‍ර ලබාදීම;

(ඈ) පර්යේෂණවල කාර්යය සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒවා නඩත්තු කිරීම ද එම පර්යේෂණවල කාර්ය සඳහා අවශ්‍ය විය හැකි අනුබද්ධ දේවල්, උපාංග හෝ උපකරණ එම පර්යේෂණ මධ්‍යස්ථානවලට ලබාදීම ;

(ඉ) පර්යේෂණ හා ඒ හා සම්බන්ධ කාර්ය සඳහා තේ වතු සහ තේ කර්මාන්ත ශාලා පවත්වා ගෙන යාම හා කළමනාකරණය කිරීම ;

(ඊ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයන් ණයට ගැනීම ;

(උ) උපදේශක සේවා හා පුද්ගලයන්, පර්යේෂණ හුවමාරුකර ගැනීම, පුද්ගලයන් පුහුණු කිරීම හෝ සාමාන්‍යයෙන් ඒවායේ පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි කාර්ය සඳහා මණ්ඩලයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පිහිටි අධ්‍යාපන හෝ වෙනත් ආයතන සමග සහයෝගතා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඌ) අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් සුරැකුම්පත්වල මණ්ඩලයේ අරමුදල් ආයෝජනය කිරීම ;

(එ) තේ වගා කිරීමේ හා නිෂ්පාදනය කිරීමේ නියැලී සිටින තැනැත්තන් සඳහා උපදෙස්, නිරූපන, තේ වගා පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණ යනාදිය මගින් ප්‍රායෝගික සහාය ලබාදීම ;

(ඒ) නියමිත ගාස්තුවක් ගෙවීම මත හෝ නොමිලයේ පරීක්ෂණ, තොරතුරු සහ වාර්තා සැපයීම ඇතුළුව සේවා සැපයීම :

(ඔ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය යම් නිලධරයන්, සේවකයන් හෝ නියෝජිතයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් පිළිබඳ විනය පාලන සහ ඔවුන් සේවයෙන් ඉවත් කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ හෝ විදේශවල ප්‍රභවයන්ගෙන් චංචල හා නිශ්චල දේපළ වශයෙන් වූ ප්‍රදාන, ත්‍යාග, රික්ථවරණ ආදිය පිළිගැනීම හා ලබාගැනීම සහ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම උදෙසා ඒවා යොදා ගැනීම ;

(ක) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන්ගේ යහපත උදෙසා අර්ථ සාධක අරමුදල් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හෝ වෛද්‍ය පහසුකම් සැලසීමේ යෝජනා ක්‍රම පිහිටුවීම සහ එම අරමුදල්වලට හෝ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම :

(ග) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම ; සහ

(ච) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

## II වන කොටස

## මණ්ඩලයේ සංයුතිය

මණ්ඩලයේ සංයුතිය.

7. (1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. එනම්—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයෝ—

(i) තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත මගින් පිහිටුවන ලද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා ; සහ

(ආ) පහත සඳහන් නම් කරන ලද සාමාජිකයෝ—

(i) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(iii) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා නම් කරනු ලබන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නියෝජිතයකු ;

(iv) විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රභූතත්ත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරින් අමාත්‍ය වරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු ,

(v) තේ කර්මාන්තයට අදාළව පළපුරුද්දක් සහ නිපුණත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු ;

(vi) වැවිලි කළමනාකරණ නියෝජිතවරු හෝ කොන්ත්‍රාත්කරුවන් නියෝජනය කරන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ;

(vii) සාමාජිකයන් එක් ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් ඇති සෑම වෘත්තීය සමිතියකම විධායකය විමසා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු;

මේ ඡේදයේ කාර්ය සඳහා "විධායකය" යන්න වෘත්තීය සමිතියක් හා සම්බන්ධව යෙදෙන විට වෘත්තීය සමිති ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ නම් මිස, ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට සුදුස්සකු නොවිය යුතු ය.

8. (1) 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ මණ්ඩලයේ නම් කරනු ලැබූ සාමාජිකයකු, ඔහුගේ නාම යෝජනා කරන ලද දිනයේ සිට ගණින් ගනු ලබන අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. ධුර කාලය.

(2) 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ මණ්ඩලයේ නම් කරන ලද යම් සාමාජිකයකු—

(අ) සිහිවිකල තැනැත්තකු බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබුවහොත්; හෝ

(ආ) වස්තු භංගත්වයට පත්ව ඇති බවට හෝ චරිත දූෂණය පිළිබඳ වරදකට වරදකරුවකු බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකු විසින් තමා නම් කරන ලද තැනැත්තා වෙත අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ මණ්ඩලයේ නම් කරන ලද යම් සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක ඒ පුරප්පාඩුව පිරවීම සඳහා 7 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය යුතු ය.

(5) 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා වෙනත් තැනැත්තකු නම් කරනු ලැබූ අවස්ථාවක, එසේ නම් කරනු ලැබූ තැනැත්තා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) රෝගාතුරවීම, අබලතාවය හෝ මාස තුනකට අඩු නොවන කාල සීමාවක් තුළ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා 7 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(7) 7 වන වගන්තියේ (1) (ආ) ඡේදය යටතේ මණ්ඩලයේ නම් කරනු ලැබූ යම් සාමාජිකයකු, මණ්ඩලයේ සාමාන්‍ය අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණියහොත්, ඔහු ධුරයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

9. (1) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ විටක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ විටක කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ හේතු කොට ගෙන ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු සභාපතිවරයා වෙනුවට වැඩ බැලීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(4) (1) සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහු සාමාජිකත්වය දරන කාලය විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

10. (1) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක ඒ රැස්වීමට පැමිණ සිටින මණ්ඩලයේ සාමාජිකයන් විසින් පත් කරනු ලබන සාමාජිකයකු විසින් රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමකදී ඡන්ද සංඛ්‍යාව සමාන වන විටක සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මේ පනත මගින් මණ්ඩලය වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, මණ්ඩලය විසින් සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(4) සභාපතිවරයා විසින් මණ්ඩලයේ රැස්වීම් කැඳවිය යුතු අතර එම රැස්වීම් මේ පනත යටතේ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි අන්දමින් නිතර පවත්වනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(6) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් හා අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් ද ඒ රැස්වීම්වල කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ද අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය විධිමත් කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කාර්ය කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන විධානවලට යටත් විය යුතු අතර එම විධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

සාමාජිකයකු නම් කිරීමේදී යම් පුරප්පාඩුවක් හෝ දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ කටයුතු නිර්බල නොවිය යුතු බව.

11. 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම නොතකා ක්‍රියා කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු අතර, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල නොවිය යුතු ය.

## III වන කොටස

### අධ්‍යක්ෂවරයාගේ බලතල හා කර්තව්‍ය

අධ්‍යක්ෂවරයා.

12. 7 (1) (අ) (i) වගන්තියේ සඳහන් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින්—

(අ) මණ්ඩලයේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, එම ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමට වගකිව යුතු ය.

(ආ) මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම ද කර්තව්‍ය ඉටු කිරීම ද කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### මුදල්

අපනයනය කරනු ලබන තේ සඳහා සෙස් බද්ද.

13. (අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව ගණන් බලනු ලැබූ සෙස් බද්දක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම තේ කිලෝග්‍රෑම් එකක් සඳහා ම අය කරනු ලැබිය යුතු අතර එයේ එම සෙස් බද්ද ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද නැවත අපනයනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ලෙස ඔප්පු කරගත් තේ සඳහා එවැනි සෙස් බද්දක් අය කරනු නොලැබිය යුතු ය;

(ආ) අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ වගන්තිය යටතේ පනවනු ලැබූ සෙස් බදු ප්‍රමාණයන් වෙනස් කරනු ලැබිය හැකි ය; නැත හොත් එම සෙස් බද්ද අවලංගු කරනු ලැබිය හැකි ය;

(ඇ) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියමයක්ම එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියමයේ සඳහන් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු අතර එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස හතරක් ඇතුළත අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ කවර හෝ නියම යක් එම අනනුමතයේ දින සිට, එම නියමය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියමයක් එසේ ප්‍රත්‍යාදිෂ්ට වී ඇති ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය;

(ඈ) මේ වගන්තිය, රේගු ආඥාපනතේ කොටසක් ලෙස සලකා බලාත්මක විය යුතු අතර එම ආඥාපනතේ විධි විධාන ඒ අනුව අදාළ විය යුතු ය;

(ඉ) මේ වගන්තිය යටතේ සෙස් බද්දෙන් අයකරගනු ලබන මුදල් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මාසිකව 14 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තේ පර්යේෂණ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. එවැනි සෑම ගෙවී මක් ම සනාථ කරන්නා වූ ලියවිලි සමග යැවිය යුතු ය;

(ඊ) මේ වගන්තිය යටතේ තේ සඳහා අයකරනු ලබන සෙස් බද්ද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තේ සඳහා පනවනු ලැබූ යම් අපනයන බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතු ය.

මණ්ඩලයේ අරමුදල.

14. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "තේ පර්යේෂණ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එම අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ද මණ්ඩලයට ලැබිය හැකි ඕනෑම සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාවෙ හෝ පිටරට කවර හෝ මූලාශ්‍රවලින් ප්‍රදාන, ත්‍යාග, රික්ථවරණ වශයෙන් ලැබිය හැකි එවැනි සියලු මුදල්;

(ඈ) 13 වන වගන්තිය යටතේ තේ සඳහා පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල්.

(3) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේදී ද මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලැබිය හැකි සියලු මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

15. (1) මණ්ඩලයේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් ද යථා පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය කටයුතු සලස්වනු ලැබිය යුතු ය. ගිණුම් විගණනය.

(2) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම මණ්ඩලයේ ගිණුම් විගණනය කළ යුතු ය. එම ගිණුම් විගණනය කිරීමේදී ඔහුට සහාය වීමේ කාර්ය සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම්ලත් යම් විගණකවරයකුගේ සේවය ලබා ගත හැකි අතර එම විගණකවරයා විගණකාධිපතිවරයාගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(4) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමේදී විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික මුදලක්, විගණකාධිපතිවරයා වෙත අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එම විගණනය පැවැත්වීමේ කාර්ය සඳහා විගණකාධිපතිවරයා විසින් සේවයේ නියුක්ත කරන ලද සුදුසුකම් ලත් යම් විගණකවරයකු හෝ විගණකවරයන්ට විගණකාධිපතිවරයා විසින් ගෙවන ලද යම් මුදලක් විගණකාධිපතිවරයාට ලැබුණ යම් පාරිශ්‍රමික මුදලකින් අඩු කිරීමෙන් පසුව ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස තිස් එක් වන දිනට පසු හැකිතාක් ඉක්මණින් එම වර්ෂය ඇතුළත මණ්ඩලයේ කටයුතු පිළිබඳ පරිපාලන වාර්තාවක් ද මණ්ඩලයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශයක් ද මණ්ඩලයට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශයක් ද පිළියෙල කරනු ලැබිය යුතුය.

(6) මේ වගන්තියේ " සුදුසුකම් ලත් විගණකවරයා " යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නාවූ ද ගණකාධිකාරිවරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක් දරන්නාවූ ද පුද්ගලයකු ; හෝ

(ආ) එක් එක් හවුල්කරුවකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරිවරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක් දරන්නාවූ ද වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් අදහස් වේ.

විගණකාධිපතිවරයාගේ ප්‍රකාශය සහ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව.

16. 15 වන වගන්තියට අනුකූලව විගණකාධිපතිවරයා විසින් පිළියෙල කරන ලද වාර්තාව ඔහු විසින් වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර අමාත්‍යවරයා විසින් එම ප්‍රකාශය හා වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරවනු ලැබිය යුතු ය.

බදුවලින් නිදහස් කිරීම.

17. මණ්ඩලයේ උපයෝගිතාවය සඳහා මණ්ඩලය විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් ආනයන බලපත්‍රයක් මත අය කළ හැකි යම් ගාස්තුවක් අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අත්හරිනු ලැබිය හැකි ය.

## *V* වන කොටස

## විවිධ

නියෝග.

18. (1) නියෝග සෑදීමට මෙ පනත මගින් නියමිතව ඇත්තා වූ හෝ බලය දී ඇත්තා වූ හෝ නියම කළ යුතු යයි ඉන් නියමිතව ඇත්තා වූ හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයකම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථානුගත කරුණුවලදී මණ්ඩලයට හෝ එහි නිලධරයන්, සේවකයන් ආදීන්ට එරෙහිව නඩු හෝ නඩු කටයුතු නොපැවරිය යුතු බව.

**19.** (1) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා මණ්ඩලයට එරෙහිව කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවකට එරෙහිව ඔහුට විරුද්ධව කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(3) යම් අධිකරණයක් ඉදිරිපිට මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් නඩුවකදී හෝ නඩු කටයුත්තකදී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී මණ්ඩලය වෙත ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඔහුට විරුද්ධව පවරා ඇති යම් නඩුවක දී හෝ නඩු කටයුත්තකදී එවැනි යම් තැනැත්තකු විසින් දරන ලද (2) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ යම් වියදමක්, සද්භාවයෙන් කරන ලදැයි හෝ කරනු ලැබූ බවට අදහස් කරනු ලැබේ යයි අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, එම වියදම්, එම නඩුවේදී හෝ නඩු කටයුත්තේදී අයකරගනු ලැබ නැත්නම්, එය අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**20.** (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රජයේ සේවයේ යම් නිලධරයෙක්, එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලනය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් රජයේ නිලධරයෙක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබුවහොත්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13(2) වන වගන්තියේ විධිවිධාන ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් රජයේ නිලධරයෙක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබුවහොත්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13(3) වන වගන්තියේ විධිවිධාන ඔහුට අදාළව හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවකදී එම තැනැත්තා විසින් මණ්ඩලයට කරනු ලබන යම් සේවා කාලයක් ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.**

21. මණ්ඩලයේ සියලුම නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**අල්ලස් පනතේ අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් විය යුතු බව.**

22. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

**වාර්තා.**

23. (1) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් නිරණය කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන් හා එවැනි ආකෘති පත්‍රවල මණ්ඩලය විසින් නිරණය කරනු ලැබිය හැකි වාර්තා හා තොරතුරු මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස මණ්ඩලය විසින් යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත පනවන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීමෙහිලා යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීම පැහැර හරින ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත පනවන ලද යම් නියමයක් අනුව ක්‍රියාකිරීමෙහිලා තමා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර වාර්තාවක හෝ තොරතුරක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඇ) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත පනවන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීමෙහි ලා තමා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර වාර්තාවක හෝ තොරතුරක යම් කරුණක් සිතාමතාම අත් හරින,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

24. (1) ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත පවරා ඇති වූ ද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන (මේ වගන්තියේ "තේ පර්යේෂණ ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) තේ පර්යේෂණ ආයතනයේ කාර්ය සඳහා නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී භාවිත කරනු ලැබුවා වූ ද සියලු චංචල හා නිශ්චල දේපළ නියමිත දිනයේ සිට බලපාන පරිදි මණ්ඩලය සතුවිය යුතු ය. අන්තර් කාලීන විධිවිධාන.

(2) තේ පර්යේෂණ ආයතනයේ කාර්ය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් හෝ එම මණ්ඩලය සමග ඇති කරගනු ලැබුවාවූද නියමිත දිනයට පෙරාතුව වන දිනයේ දී බලාත්මකව පැවතියාවූද සියලු කොන්ත්‍රාත්, ගිවිසුම් සහ තේ පර්යේෂණ ආයතනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඇති කරගනු ලැබූ නියමිත දිනයට පෙරාතුවම දිනයේදී පැවති සියලු වගකීම් ද නියමිත දිනයේ සිට බලපාන පරිදි මණ්ඩලය විසින් හෝ එය සමග ඇති කරගත් කොන්ත්‍රාත්, ගිවිසුම් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) තේ පර්යේෂණ ආයතනයට අදාළව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබුවා වූ ද නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී විනිශ්චයකට භාජනය පවතින්නා වූ ද සියලු නඩු හා නඩු කටයුතු, නියමිත දිනයේ සිට බලපාන පරිදි මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරන ලද නඩු හෝ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා දිගටම පවත්වාගෙන යා යුතු ය.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"සභාපතිවරයා" යන්නෙන් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් 7(2) වන වගන්තිය යටතේ නම් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා තේ මණ්ඩලය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා තේ මණ්ඩලය අදහස් වේ;

"සකස් කළ තේ", "තේ", "තේ කර්මාන්ත ශාලාව" සහ "තේ ගස" යන යෙදුම්වලට 1957 අංක 51 දරන තේ පාලන පනත මගින් එම යෙදුම්වලට දී ඇති අර්ථම තිබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.